# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2489/08 - 2026 මැයි මස 18 වැනි සඳුදා - 2026.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2019 අංක 24 දරන ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත**

21 වන වගන්තිය යටතේ සිදුකරනු ලබන නියමය

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ (පා.ම) වන මා විසින් 2019 අංක 24 දරන ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනතේ 21 වගන්තිය ප්‍රකාරව මෙම පනතේ නෛතික ප්‍රතිපාදන ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදවීම සඳහා පහත සඳහන් අධ්‍යක්ෂ/ප්‍රධානියාගෙන් සමන්විත විශේෂ විමර්ශන ඒකකයක් අවුරුදු (03) කාලසීමාවක් සඳහා 2026.02.15 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන අතර මෙම පනතේ පැවරී ඇති බලතල හා කාර්යයන් ප්‍රකාරව කටයුතු කිරීමට එම ඒකකයට මෙයින් නියම කරමි.

සහකාර පොලිස් අධිකාරි, එම්. පී. සී. සී. ද සිල්වා මහතා - අධ්‍යක්ෂ/ප්‍රධානියා

**සුනිල් කුමාර ගමගේ** (පා.ම.),
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය.

2026 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 05 - 0195